මහා සභාව
**2022-01-13**

**වයඹ පලාත් පාලන දෙපාර්තමේන්තුව**

**වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව**

**2021 වර්ෂයේ / 47 වන සභා වාරයේ මහා සභා රැස්වීම් වාර්තාව - කෙටුම්පතකි.**

**2022-01-13**

**පැමිණීම**

1. ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතා
2. ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා
3. ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා
4. ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා
5. ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා
6. ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා
7. ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය
8. ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා
9. ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා
10. ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා
11. ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා
12. ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
13. ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා
14. ගරු මන්ත්‍රිනී ජී.ලීනා ප්‍රියංගිකා පෙරේරා මහත්මිය
15. ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය
16. ගරු මන්ත්‍රී කේ.නොඑල් සුදත් ජානක පෙරේරා මහතා
17. ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය
18. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ප්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා
19. ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා
20. ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා
21. ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා
22. ගරු මන්ත්‍රී ජී.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා
23. ගරු මන්ත්‍රී එච්.ඒ.ක්ලීටස් පෝල් පෙරේරා මහතා
24. ගරු මන්ත්‍රී ඩබ්. ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා
25. ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා
26. ගරු මන්ත්‍රී එල්. සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා

27. ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා
28. ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා
29. ගරු මන්ත්‍රී ඩබ්.සුරේන් ඇන්ටන් ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා
30. ගරු මන්ත්‍රීනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය
31. ගරු මන්ත්‍රීනී පී.එම්.ලිහිණි අනුත්තරා ප්‍රභාෂි මෙනවිය
32. ගරු මන්ත්‍රීනී එම්.එම්.මේරි.වාලට් කුරේ මහත්මිය
33. ගරු මන්ත්‍රීනී ඩබ්.දුලක්ෂි වමෝදරී ප්‍රනාන්දු මෙනවිය
34. ගරු මන්ත්‍රීනී ආර්.පී.නදීකා රණවීර මහත්මිය
35. ගරු මන්ත්‍රී වී.ඒ.වර්ණ රංග ගුණසේකර මහතා
36. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා
37. ගරු මන්ත්‍රීනී ඒ.එම්.චමිලා දිල්රුක්ෂිකා මහත්මිය
38. ගරු මන්ත්‍රී වී.කේ.එම්.අසන්ත කුලසේකර මහතා
39. ගරු මන්ත්‍රී අයි.බී.සෑම් හරිෂ්නාත් සරත්චන්ද්‍ර මහතා
40. ගරු මන්ත්‍රී එස්.එම්.දර්ශන දිමුතු කුමාර සුභසිංහ මහතා

මෙදින පෙ.ව.10.00ට මහා සභා රැස්වීමේ කටයුතු ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීම් ශාලාවේදී ආරම්භ විය.

ආගම සිහිකිරීමෙන් අනතුරුව මහා සභා රැස්වීම සඳහා සහභාගී වී සිටින ගරු උපසභාපතිතුමා ඇතුළු සියළුම ගරු මන්ත්‍රීතුමන්/තුමියන් හා සහභාගී වී සිටින ලේකම්මහතා හා එම නිලධාරීන් ඇතුළු සියළු දෙනාම මහා සභා රැස්වීම සඳහා ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදී.

## 01.2021.12.09 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම.

තීරණ අංක 01

2021-12-09 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව **සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ ගරු යූ.ජුඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.**

## 02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන

01. නිවාඩු අනුමත කිරීම

a) මහා සභාව සඳහා නොපැමිණෙන ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම.

තීරණ අංක 02

අදදින මහා සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව දන්වා නිවාඩු අයදුම්කර ඇති පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සඳහා ගරු සභාපතිතුමා ඉදිරිපත් කල යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

- ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා
- ගරු මන්ත්‍රී එම්.ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා
- ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා
- ගරු මන්ත්‍රී එස්.එම්.සුදත් චන්දන මහතා

b) කාරක සභා සඳහා නොපැමිණි ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම.

මෙම වර්ෂයේවත් කාරක සභා සඳහා පැමිණ ඉදිරි කටයුතු සඳහා දායකත්වය ලබාදෙන ලෙසට ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

තීරණ අංක 03

2021 නොවැම්බර් මස සහ 2021 දෙසැම්බර් මස කාරක සභා සඳහා **සහභාගී නොවූ පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

**2021 දෙසැම්බර් මස 12 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව**

| අ/අ | සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ/මන්ත්‍රීවරියන්ගේ නම |
|---|---|
| 1. | ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා |
| 2. | ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා |
| 3. | ගරු මන්ත්‍රී කේ. නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා |
| 4. | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |
| 5. | ගරු මන්ත්‍රී ඩබ්. ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා |

| | |
|---|---|
| 6. | ගරු මන්ත්‍රිනි එච්.එම්. සුදර්ශි භාග්‍යා කරුණාරත්න මෙනවිය |
| **2021 දෙසැම්බර් මස 28 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව** | |
| අ/අ | **සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ/මන්ත්‍රීවරියන්ගේ නම්** |
| 1. | ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා |
| 2. | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |
| 3. | ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා |
| 4. | ගරු මන්ත්‍රී ඩබ්. ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා |
| 5. | ගරු මන්ත්‍රිනි එච්.එම්. සුදර්ශි භාග්‍යා කරුණාරත්න මෙනවිය |
| **2021 දෙසැම්බර් මස 03 වන දින පැවති මාර්ග, ඉඩම් , ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභාව** | |
| අ/අ | **සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ/මන්ත්‍රීවරියන්ගේ නම්** |
| 1. | ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| 2. | ගරු මන්ත්‍රී ඩබ්. ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා |
| 3. | ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා |
| 4. | ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රිනාත් ප්‍රනාන්දු මහතා |
| **2021 දෙසැම්බර් මස 24 වන දින පැවති මාර්ග, ඉඩම් , ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභාව** | |
| අ/අ | **සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ/මන්ත්‍රීවරියන්ගේ නම්** |
| 1. | ගරු මන්ත්‍රී එම්.එම්.ජී.විශ්වනාත් මංචනායක මහතා |
| 2. | ගරු මන්ත්‍රී ඩබ්. ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා |
| 3. | ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| 4. | ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා |
| 5. | ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රිනාත් ප්‍රනාන්දු මහතා |
| **2021 දෙසැම්බර් මස 30 වන දින පැවති මාර්ග, ඉඩම් , ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභාව** | |
| අ/අ | **සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ/මන්ත්‍රීවරියන්ගේ නම්** |
| 1. | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |
| 2. | ගරු මන්ත්‍රී ඩබ්. ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා |
| 3. | ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| 4. | ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා |
| 5. | ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රිනාත් ප්‍රනාන්දු මහතා |
| 6. | ගරු මන්ත්‍රී ජී.කේ.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා |
| **2021 දෙසැම්බර් 17 වන දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභාව** | |
| අ/අ | **සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ/මන්ත්‍රීවරියන්ගේ නම්** |
| 1. | ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| 2. | ගරු මන්ත්‍රී කේ.එන්.සුදත් ජානක පෙරේරා මහතා |
| 3. | ගරු මන්ත්‍රී ඩී.එල්. අමල් සුරංග මහතා |
| 4. | ගරු මන්ත්‍රී ඩබ්. ස්ටැන්ලි තිසේරා මහතා |
| 5. | ගරු මන්ත්‍රී ඩී. නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා |

| | |
|---|---|
| 6. | ගරු මන්ත්‍රී වී.කේ.එම්. අසන්ත කුලසේකර මහතා |
| **2021 දෙසැම්බර් 28 වන දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සභාව** | |
| **අ/අ** | **සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ/මන්ත්‍රීවරියන්ගේ නම්** |
| 1. | ගරු මන්ත්‍රී එල්.කේ .ජගත් ප්‍රියංකර මහතා |
| 2. | ගරු මන්ත්‍රී කේ. නොඑල් සුදත් ජානක පෙරේරා මහතා |
| 3. | ගරු මන්ත්‍රී ඩබ්. සුරේන් ඇන්ටන් ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා |
| 4. | ගරු මන්ත්‍රී එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා |
| 5. | ගරු මන්ත්‍රිනි ආර්.පී. නදීකා රණවීර මහත්මිය |
| 6. | ගරු මන්ත්‍රී ටී.බී.ඩී. ඇන්ටනි කුමාර් මහතා |
| 2021 දෙසැම්බර් 01 වන දින පොදු පහසුකම් හා ආපදා කලමනාකරණ කාරක සභාව | |
| **අ/අ** | **සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ/මන්ත්‍රීවරියන්ගේ නම්** |
| 1. | ගරු මන්ත්‍රී ඩබ්. ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා |
| 2. | ගරු මන්ත්‍රී ඩබ්. ස්ටැන්ලි තිසේරා මහතා |
| 3. | ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා |
| 4. | ගරු මන්ත්‍රී ඩී. එල්.අමල් සුරංග මහතා |
| 5. | ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණශාන්ති විජේතුංග මහතා |
| 6. | ගරු මන්ත්‍රී දර්ශන දිමුතු කුමාර සුහසිංහ මහතා |
| 2021 නොවැම්බර් මස 26 වන දින පැවති සංවර්ධන උපදේශක කාරක සභාව | |
| **අ/අ** | **සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ/මන්ත්‍රීවරියන්ගේ නම්** |
| 1. | ගරු මන්ත්‍රී එල්.කේ .ජගත් ප්‍රියංකර මහතා |
| 2. | ගරු මන්ත්‍රී එල් සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා |

02. 2022 ජනවාරි මස 03 වන දින රාජ්‍ය ප්‍රතිපත්ති අනුව අප සභාවේ නව වසරේ වැඩ කටයුතු ආරම්භ කල බවත්, එම අවස්ථාවට පැමිණි දුම්මලදෙණිය විහාරස්ථානයේ නායක ස්වාමීන් වහන්සේ මෙන්ම වෙන්නප්පුව දේවස්ථානයේ පියතුමාටද එමෙන්ම පලාත් සභා මන්ත්‍රීවරුන් දෙපල ඇතුළු සියළුම ගරු මන්ත්‍රීතුමන්ලාට සහ ගරු මන්ත්‍රීතුමියන්ලාටද විපක්ෂනායකතුමාට ද විශේෂ ස්තූතියක් පුද කරන ලදී.

03. 2021 වර්ෂයේ නත්තල් උත්සවය සඳහා අවසර ගැනීමට පමා වූ බවත්, එබැවින් එම උත්සවය ජනවාරි මස 11 වන දින පැවැත්වීම කටයුතු කල බවත් කහටවිල කොට්ඨාසයේ කහටවිල පන්සල සහ කහටවිල පල්ලිය මෙවර තෝරා ගත් බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. අඩුආදායම්ලාභී දරුවන් 350කට පමණ සපත්තු ලබා ගැනීමට කූපන් පතක් සභාව මඟින් ලබා දුන් බවත් එය සංවිධානය කිරීම වෙහෙස මහන්සි වූ කොට්ඨාස භාර ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මියටද එමෙන්ම ප්‍රජා සංවර්ධන කමිටු සභාපති ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ඇතුළු කමිටු සාමාජිකයින් සියළුම දෙනාටද ස්තූතිය පුද කරන ලදී.හාල්දඩුවන මීසම් පාලක පියතුමා සහ කහටවිල පන්සලේ නායක ස්වාමීන් වහනසේ විසින් අගනා කාර්යභාරයක් ඉටු කර දුන් බවත් එතුමන්ලා විසින් දරුවන් මේ සඳහා තෝරා දුන් බවත් එබැවින් එතුමන්ලාටද විශේෂ ස්තූතියක් පුද කරන ලදී.

එමෙන්ම සියළුම දහම් ගුරුවරුන්ට ගෙවතු වගා සංකල්පය ක්‍රියාත්මක කිරීමේ මූලික සංකල්පය අනුව පැල ලබා දුන් බවත්, හෙලබිම පරිසර සංවිධානයෙන් ඒ සඳහා සහයෝගය දුන් බැවින් එම සංවිධානයටද ස්තූතිය පුද කරන ලදී.

04. පසුගිය වර්ෂය විශාල වැඩ කොටසක් සිදු කල වර්ෂයක් බවත්,ඒ සඳහා සහයෝගය ලබා දුන් ගරු උපසභාපතිතුමා ඇතුළු පක්ෂයේ සියළුම ගරු මන්ත්‍රීතුමන්/තුමියන්ලාටද එමෙන්ම විපක්ෂනායකතුමා ඇතුළු විපක්ෂ මන්ත්‍රීවරුන්/වරියන් සියළුම දෙනාටද ලේකම්තුමා ප්‍රමුඛ සියළුම නිලධාරීන් හා සේවක මහත්මමහත්මීන් සියළුම දෙනාටද ස්තූතිය පුද කරන ලදී.

05. " වයඹ අභිමානය" ලෙස වයඹ පලාත තුළ සුවිශේෂී ස්ථානයක් හිමිකරගන්නට අප ප්‍රාදේශීය සභාවට හැකි වී ඇති බවද, තවදුරටත් මුළු වයඹටම සමස්ථ දිවයිනටම ආදර්ශයක් ලෙස අප සභාව කටයුතු කල යුතු බවද පෙන්වා දෙමින් ඒ සඳහා සභා රීති හා අණ පණත් පිළිපදිමින් කටයුතු කිරීම සුදුසු බවද ගරු සභාපතිතුමා විසින් ලෙන්වා දෙන ලදී.

ඒ අනුව ආදර්ශමත් සභාවක් ලෙස කටයුතු කිරීම සඳහා අද සිට සභා රීති පිළිබඳව සියළු දෙනාම දැනුවත් කරමින් ඩිජිටල් තිරය මත සභා රීති පිළිබඳව ප්‍රදර්ශනය කල අතර ගරු මන්ත්‍රීවරුන් වෙත එම රීති වලට අදාල මුද්‍රිත පිටපතක් බැගින්ද ලබා දෙන ලදී. මෙම රීති හා අණ පණත් ප්‍රායෝගික භාවිතය තුලින් " වයඹ අභිමානය" සාක්ෂාත් කර ගැනීම සඳහා සහය වන ලෙසද ගරු සභාපතිතුමා ඉල්ලා සිටින ලදී.

06. ඩිජිටල් තිරය ඔස්සේ පසුගිය වසරේ වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ප්‍රගතිය සියළුම දෙනාට දැක ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.මෙලෙස වැඩ කටයුතු සාර්ථක කර ගැනීමට හැකි වූයේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ, ගරු අග්‍රාමාත්‍යතුමාගේ, ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ, ගරු රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මැතිතුමාගේ, එමෙන්ම පලාත් සභා ගරු මන්ත්‍රීවරුන් දෙපල වන ගරු ට්‍රෙවින් ප්‍රනාන්දු මැතිතුමා සහ ගරු සන්ද්‍යා රාජපක්ෂ මැතිතුමා ඇතුළු රාජ්‍ය නිලධාරී සියළුම දෙනාගේ එකමුතුව නිසා බවත් ගරු සභාපතිතුමා වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදී.

## 03.යථා පරිදි කල් දී ඇති යෝජනා

### a. ගරු සභාපතිතුමාගේ යෝජනා

i. රණවිරු සේවා අධිකාරිය විසින් සෙ/551407 මාණ්ඩලික සැරයන් සමින්ද බණ්ඩාර මහතා සඳහා පිහිණුම් තටාක පහසුකම් ලබා ගැනීම වෙනුවෙන් ඉදිරිපත් කර ඇති ලිපිය සඳහා සභා අනුමැතිය බා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

වාර්තාවක් සමඟ මෙය ඉදිරිපත් කිරීමට තිබූ බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

ඉල්ලීම් ලිපිය ඉදිරිපත් කල බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මොහුට පාදයක් අහිමි බැවින් වගකීමක් සභාවට තිබෙන බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී. දක්ෂ පිහිණුම්කරුවෙකු වුවද සේවක සහයක් තිබිය යුතු බවද සභාපතිතුමාට වගකීම දැරීමට සිදු වන බවද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

කකුල ඉවත් කල නමුත් මොහු අබාධිත තත්ත්වයක නොසිටින බවත්, එය ඉවත් කර වසර 15කටත් වඩා වැඩි බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී. රට බේරා ගැනීමට ගොස් මෙය සිදු වූ බවත්, අප ප්‍රදේශයේ පලමුව ආබාධිත වූ රණවිරුවා මොහු බවත් එකම තැන සිටන බැවින් කකුල දැමූ පසුව ඇවිද ව්‍යායාම කිරීම අපහසු බවත්,එම නිසා දෙවරක්

නැවතත් ශල්‍යකර්ම සිදු කල බවත් ප්‍රකාශ කරන ලදී. මොහු සිටි දක්ෂ ක්‍රීඩකයෙකු බවත් දැනට මොහුට කිරීමට හැක්කේ පිහිණුම් බවත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම මීට පෙර පුහුණුකරුවෙකු යටතේද පුහුණු වූ බවත්, පිහිණීමට පැමිණෙන සියළුම දෙනාගේ වගකීම සභාව නොගන්නා බවද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.යුධ හමුදාවෙන් පවා ලිඛිතව ඉල්ලීමක් කර ඇති බැවින් අප මෙයට සම්බන්ධ නොවන අන්දමින් කොන්දේසි යටතේ ඉල්ලීම ඉෂ්ඨ කර දිය හැකි බවත් ගෙවීම් කර පුහුණු කරුවෙක් ලබා ගන්නා ලෙසට අපට දැනුම්දිය නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා තමන් පැවසූ දෙය තේරුම් නොගත් බවත් ඔහු අසනීප බැවින් ඔහුට තනිව තටාකයේ සිටීමට සහ වේලාවක් ලබා දීමට සිදු වන බවත්මෙහිදී වගකීම දැරිය යුත්තේ කවුරුන්දැයි යන්න තමන් විමසූ බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී. ඔහුත් සමඟ සාකච්ඡා කොට මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කර මෙම වැඩ කටයුත්ත සිදු කරමුයැයිද ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 04

රණවිරු සේවා අධිකාරිය විසින් සෙ/551407 මාණ්ඩලික සැරයන් සමින්ද බණ්ඩාර මහතා සඳහා පිහිණුම් තටාක පහසුකම් ලබා ගැනීම වෙනුවෙන් ඉදිරිපත් කර ඇති ලිපිය **සම්බන්ධයෙන් දීර්ඝ ලෙස සාකච්ඡා කල ගරු මහා සභාව මෙම මහතා සමඟද සාකච්ඡා කර විශේෂ අවධානයක් එතුමා කෙරෙහි යොදවමින් පිහිණුම් තටාක පහසුකම් ලබා දීම සුදුසු බවට තීරණය කරන ලදී. මෙම යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල අතර ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

ii. දංකොටුව ධර්ම ප්‍රදීපාරාම දහම් පාසලට ඩෙස් බංකු ලබා ගැනීම වෙනුවෙන් ඉදිරිපත් කර ඇති ලිපිය සඳහා සභා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

මෙහිදී එහි දැනට තිබෙන ඩෙස් බංකු ගුල්ලෝ ගසා ඇති බවත්, පන්සලේ නායක හාමුදුරුවන්ගේ ඉල්ලීමක් ලැබී ඇති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. මේ පිළිබඳව කොට්ඨාස භාර ගරු මන්ත්‍රී ජී.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා දන්නා බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. පරණ කැඩී ඇති ඩෙස් බංකු තිබෙන බැවින් ඒවා ප්‍රතිසංස්කරණයට සහය වෙමුයැයිද ඒ සඳහා කොට්ඨාස භාර ගරු මන්ත්‍රී ජී.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා සම්බන්ධ වී වාර්තාවක් ලබාදෙන ලෙසටද යෝජනා කරන ලදී.

තීරණ අංක 05

මෙහිදී ප්‍රයෝජනයට ගත හැකි ඩෙස් බංකු බොහෝමයක් තිබෙන බැවින් කොට්ඨාස භාර ගරු මන්ත්‍රීතුමා මැදිහත් වී ගණනය කර එම ඩෙස් බංකු ප්‍රතිසංස්කරණය කර දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදී. ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

- ගරු මහා සභාව අවස්ථාවේදී ජේෂ්ඨ ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතාට ලබා දීමට තිබූ රු.50,000ක වෛද්‍ය ආධාර මුදල ලබා දීමට ගරු සභාපතිතුමා කටයුතු කරන ලදී.

මෙම අවස්ථාවේදී අදහස් දක්වමින් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව තමන්ට වෛද්‍යාධාර මුදල ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිය

පුද කරන ලදී. තමන් මහජන මුදලින් වෛද්‍යාධාර ඉල්ලා නොසිටි බවත්, නමුත් එය ජේෂ්ඨතම මන්ත්‍රීතුමාට ලබා දිය යුතු බව පවසමින් ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා විසින් මෙම යෝජනාව සභාවට ගෙන ආ බවත් එහිදී රු.50,000ක් ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින්ද යෝජනා කල බවත් ඒ සඳහා ස්තූතිය පුද කරන ලදී. තවද මෙම ගෙවීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ප්‍රමාද වන විට ආවරණ අනුමැතියට යටත්ව මෙය ලබාදෙන ලෙසට ජේෂ්ඨ ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා පැවසුවද තමන් එයටද අකමැති වූ බවත් ප්‍රකාශ කරන ලදී. අද දින මෙය ලැබුණු බවත් ඒ සඳහා තම ස්තූතිය ප්‍රණාමය හා දේව ආශිර්වාදය සියළුම දෙනාට ප්‍රාර්ථනා කරමින්ද තම කතාව අවසන් කරන ලදී.

ගරු සභාපතිතුමා හා ලේකම්තුමාද මේ සම්බන්ධයෙන් විශාල උත්සාහයක දැරූ බවත්, මෙම විශය පථය අයත් වන කමිටු සභාපති ලෙස තමන්ද මේ සම්බන්ධයෙන් සතුටු වන බවත්, මෙ සතුටින් භාර ගත්තේයැයි තමන් මෙන්ම කමිටු සාමාජිකයින්ද විශ්වාස කරන බවත් නිරෝගී සුවය ලැබේවායිද ප්‍රාර්ථනා කරමින් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා තම කතාව අවසන් කරන ලදී.

## b.ගරු මන්ත්‍රී යෝජනා

i. නැ/නයිනමඩම ප්‍රධාන පාරින් ආරම්භ වී එම්.රොෂාන් බන්දුල මහතාගේ නිවස අසලින් අවසන් වන මාර්ගය "සදාසරණ මාවත" ලෙස නම් කිරීමට අදාලව ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ෆ්‍රිඩ් ශවීන් ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු සභාපතිතුමා ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

තීරණ අංක 06

නැ/නයිනමඩම ප්‍රධාන පාරින් ආරම්භ වී එම්.රොෂාන් බන්දුලගේ නිවස අසලින් අවසන් වන මාර්ගය "සදාසරණ මාවත" ලෙස නම් කිරීමට අදාලව ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ෆ්‍රිඩ් ශවීන් ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

- **මාර්ගයේ නම -සදාසරණ මාවත**
- **ආරම්භක ස්ථානය- හලාවත - කොළඹ ප්‍රධාන පාර**
- **අවසන් වන ස්ථානය-නිවස (එම්.රොෂාන් බන්දුල නිවස)**
- **මාර්ගයේ දිග- මීටර් 148**
- **මාර්ගයේ පළල- මීටර් 3**
- **ග්‍රාම සේවා වසම- නැ/නයිනමඩම**

ii. බ/කහටවිල තිලකරත්න මහතාගේ නිවස අසලින් ආරම්භ වී රංජිත් මහතාගේ නිවස අසලින් අවසන් වන මාර්ගය "නෙළුම් මාවත" ලෙස නම් කිරීමට අදාලව ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු සභාපතිතුමා ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

තීරණ අංක 07

බ/කහටවිල තිලකරත්න මහතාගේ නිවස අසලින් ආරම්භ වී රංජිත් මහතාගේ නිවස අසලින් අවසන් වන මාර්ගය "නෙළුම් මාවත" ලෙස නම් කිරීමට අදාලව ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව **ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

- **ආරම්භ වන ස්ථානය -** තිලකරත්න මහතාගේ නිවස අසලින්
- **අවසන් වන ස්ථානය -** රංජිත් මහතාගේ නිවස අසලින්

- **මාර්ගයේ දිග- මීටර් 200**
- **මාර්ගයේ පළල - මීටර් 3.6**
- **ග්‍රාම සේවා වසම - බ/කහටවිල**

**04. කාරක සභා වාර්තා සලකා බැලීම.**

i. 2021.12.21සහ 2021.12.28 වන දින වල පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තා සලකා බැලීම

2021.12.21 කමිටු වාර්තාවේ 07 වන පිටුවේ රූස්වීම් ශාලාවේ සිවිලිම ගැසීම සම්බන්ධයෙන් සටහන් වන බවත්, එය කර්මාන්ත කමිටුවට ඉදිරිපත් කරන ලෙසට ඉල්ලීමක් කල බවත් නමුත් අද වන තෙක් ඇස්තමේන්තුවක් කර්මාන්ත කමිටුවට නොපැමිණි බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී. සභාපතිතුමාගේ අභිමතයට මිලියන 02කට අනුමැතිය මුදල් පණතේ තිබෙන බවත් ඒ මත මෙය ක්‍රියාත්මක වූ බවත් ප්‍රකාශ කරන ලදී.

ගෙවීම් කිරීමට පෙර එම ඇස්තමේන්තුව කර්මාන්ත කමිටුවට යොමු කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

| |
|---|
| තීරණ අංක 08<br><br>2021.12.21සහ 2021.12.28 වන දින වල පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තා සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මියගේ හා ගරු මන්ත්‍රී ආර්.පි. අකිල ශිරංග රාජපක්ෂ මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවල සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී. |

ii. 2021-12-17 වන දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා වාර්තාව සලකා බැලීම

ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව ඵලදායී යෝජනා ක්‍රියාත්මක කිරීමේදී ප්‍රාදේශීය සභාවේ නිලධාරීන් කිසිඳු අයුරකින් කමිටු වලට සහභාගී නොවන බව ප්‍රකාශ කරන ලදී. තාක්ෂණ නිලදාරීන් එමෙන්ම ආදායම් පරීක්ෂකවරුන් කමිටු සඳහා නොපැමිණෙන බවත් තීන්දු තීරණ ක්‍රියාත්මක කිරීමේදී එය විශාල ගැටළුවක් වන බවත් ප්‍රකාශ කරන ලදී. මාසයකට පෙර අදාල කමිටුව තිබෙන දිනය දැනුම් දෙන බැවින් අදාල දිනයට නිලධාරීන්ව සහභාගී කරවන ලෙසද ඉල්ලා සිටින ලදී.

ප්‍රදේශයේ පරිසරයට හානිවන ව්‍යාපාර විශාල සංඛ්‍යාවක් තිබෙන බවත්, ඒවා නියාමනයක් විය යුතු බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා තවදුරටත් අදහස් දක්වමින් ප්‍රකාශ කරන ලදී. විදුලි සංදේශන කුළුණු විශාල සංඛ්‍යාවක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තිබෙන බවත්, වසරට රු.3000ක් පමණක් බලපත්‍ර ගාස්තු ලෙස ගන්නා බවත් නමුත් තත්පරයට ඔවුන් ලක්ෂ ගණනක් උපයන බවත් ප්‍රකාශ කරන ලදී. මේ සඳහා වාර්ෂිකව වැඩි බලපත්‍ර ගාස්තුවක් ගැනීමට යම් ක්‍රමයක් සකසන ලෙසද ඉල්ලා සිටින ලදී.

මහා සභා යෝජනාවකින් වාර්ෂිකව බලපත්‍ර ගාස්තු වැඩි කිරීමට හැකිදැයි ගරු සභාපතිතුමා විමසා සිටින ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම්මහතාට තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව එය සභාවෙන් වෙනස් කල නොහැකි බවත් මෙම බදු මුදල අය කර ගැනීම සම්බන්ධව පාර්ලිමේන්තුව මඟින් සම්මත කර ඇති 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පණතේ 100 වැනි වගන්තිය මඟින් සිදු කර ඇති බවත් පෙන්වා දෙන ලදී. මෙම බදු මුදල් අය කර ගැනීමේදී එහි වාර්ෂිකව පැනවිය යුතු මුදල සඳහන් කර තිබෙන බවද, මේ සම්බන්ධයෙන් ඉහළ දේශපාලන අධිකාරිය සමඟ සාකච්ඡා කර ප්‍රාදේශීය සභා පණත සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සුදුසු බවද පෙන්වා දෙන ලදී.

වෙලඳ බලපත්‍ර ගාස්තුව මේ වන තෙක් රු.3000ක් ගන්නා බැවින් ඒ පිළිබඳව ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී. ඔවුන් මාර්ගයේ රඳහන් ඇදීමට යාමේදී සභාව මඟින් සාකච්ඡා කොට මිලක් තීන්දු කල පසුව ඔවුන් එම මුදල ගෙවූ බවත් මේවා සභාවට ආදායම් ලැබෙන මාර්ග බවත් ප්‍රකාශ කරන ලදී.මේවා සම්බන්ධයෙන් වැඩ පිළිවෙලක් යොදන ලෙසටද ප්‍රකාශ කරන ලදී. වාහන දුම් පරීක්ෂා කරන ආයතන තිබෙන බවත්, ඔවුන්ගේද කිසිඳු නියාමනයක් නොමැති බවත් පරිසරයට හානි සිදු කරමින් අසීමිත මුදලක් ලබා ගන්නා බවද ප්‍රකාශ කරන ලදී. මේවා සඳහාද යම් වැඩ පිළිවෙලක් සකස් කරන ලෙසද බලපත්‍ර ගාස්තුවක් පැනවීමට කටයුතු කරන ලෙසටද යෝජනා කරන ලදී.

පරිසර කමිටු සභාපතිතුමා කල යෝජනාව සම්බන්ධයෙන් සභාවට තිබෙන නෛතික තත්ත්වය සොයා බැලිය යුතු බවත්, මෙම යෝජනා සම්මත කර මේ පිළිබඳ තීන්දුවක් ලබාදෙන ලෙසට ඉහළට යොමු කරමුයැයිද ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 09

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පණත අනුව දැනට සිදු කරනු ලබන බදු අය කර ගැනීම් කාලීනව ප්‍රමාණවත් නොවන බැවින් මේ පිළිබඳව සැලකිල්ලට යොමු කර වාහන දුම් පරීක්ෂා කරන ආයතන වලින් මෙන්ම විදුලි සම්ප්‍රේෂණ කුළුණු වලින් අය කරනු ලබන බදු මුදල වැඩි කිරීම සඳහා පලාත් සභා සහ පලාත් පාලන අමාත්‍යාංශය වෙත ලිඛිත යෝජනාවක් ඉදිරිපත් කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා **යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

පැළ වර්ග රෝපණය කිරීම වැනි නව ව්‍යාපෘති කීපයක්ම පැමිණ තිබෙන බවත්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අදාල නිලධාරියා දුම්මලදෙණිය කාර්යාලයේ සිටින බවත්, එතුමාව කමිටුවට ගෙන්වා දැනුම ලබා ගන්නා ලෙසටද ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

තීරණ අංක 10

2021.12.17 වන දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා වාර්තාව සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රීජ් එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව එළඹෙන නිදහස් උත්සවය පෙරවාර් 04 වන දින යෙදෙන බැවින් සභාවේ වැඩපිළිවෙලක් ඒ සඳහා ක්‍රියාත්මක කරමුයැයි සාකච්ඡා කොට තිබෙන බවත්, එබැවින් ගෙවතුවගා වැඩසටහනක් ක්‍රියාත්මක කරමුයැයි අදහස් කරගෙන සිටින බවත් ප්‍රකාශ කරන ලදී.එක් ග්‍රාම සේවා වසමකට එක් ගෙවත්තක් බැගින් නිර්මාණය කරමුයැයිද යෝජනා කරන ලදී. ඒ සඳහා ලබාදිය හැකි ප්‍රතිපාදනයක් ලබා දෙන ලෙසටද ඉල්ලා සිටින ලදී.

මෙහිදී රු.100,000ක මුදලක් එම වැඩ සහහනට වෙන් කරමුයැයි ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී.

රු.1000ක් සහ එක් කොම්පෝස්ට් පැකට් එක බැගින් ලබා දෙමුයැයි ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී සියළුම මන්ත්‍රීවරුන්ද තම ගෙවත්ත සකස් කර එම ආදර්ශය ලබාදෙමුයැයි ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය පෙබරවාරි 03 වන දින ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

බට් කල ගම්මිරිස් පැළ තිබෙන බවත් එවායෙහි එල හොඳින් හට ගන්නා බැවින් එය නිවැරදිව රෝපණය කර ගැනීමට හැකි වුවහොත් පැල 500ක් ලැබෙන බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

කුණු දමා ගොඩ කරන ලද දුම්මලදෙණිය ඉඩමේ අයිතිකරුගෙන් අසා මී ගස් පේළියක් හෝ මොනයම් පැළ වර්ගයක් රෝපණය කරමුයැයිද ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා අදහස් දක්වමින් ප්‍රකාශ කරන ලදී.

එහිද පෙබරවාරි 04 වන දින පැලරෝපණය කරමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙයට සමගාමීව ගං ඉවුරු වල උණගස්, ගිංපොල් කුඹුක් වැනි පැළ සිටවමුයැයිද ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා යෝජනා කරන ලදී.

මෙම ව්‍යාපෘතිය පරිසර කමිටු ගරු සභාපති ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ඇතුළු කමිටුවේ සංවිධානයෙන් සූදානම් කනර ලෙසට ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

තීරණ අංක 11

පෙබරවාරි 04 වන දින යෙදෙන ජාතික නිදහස් දිනය නිමිත්තෙන් එක් ග්‍රාම සේවා වසමකට එක් ගෙවත්තක් බැගින් සියළුම ග්‍රාම සේවා වසම් ආවරණය වන පරිදි ගෙවතු සකස් කිරීමට රු.100,000ක මුදලක් සභා අරමුදලින් ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබාදෙන ලදී.

iii. 2021.12.03, 2021.12.24 සහ 2021.12.30 වන දින පැවති මාර්ග, ඉඩම්, ගොඩනැගිලි හා කාර්මික සේවා කාරක සභා වාර්තා සලකා බැලීම

2021-12-03 වන දින කමිටු වාර්තාවේ තුන්වන පිටුවේ " පොතුවටවන කොටස් කල ඉඩමේ තවත් ඉඩම් කීපයක් ඇති බැවින් එයින් කොටසක් සභාව වෙත ලබා ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රීනී නයෝමි රම්‍යලතා මහත්මිය යෝජනා කරන ලදී." ලෙස සඳහන් වන බවත්, එම ඉඩමේ පොදු කොටසක් නොමැති බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී. ස්ථාන පරීක්ෂාවේදී සභා අනුමැතිය ලැබී ඇති බවට පුවරුවක් සවිකර තිබූ බවද ප්‍රකාශ කරන ලදී.

ඉඩම ලබාදෙන ආකාරයට පොදු කොටස වෙන්වන බවත්, අක්කර 2ට වඩා වැඩි නම් පොදු කොටසක් ලැබෙන බව නීතියේ තිබෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මේ වන විට පණත වෙනස් වී ඇති බවට ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

අතුරු ව්‍යාවස්ථාව වැඩ අධිකාරි මහතා ගොස් ගෙනැවිත් තිබූ බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

අළුතින් කොටස් කරන ඉඩම් වලින් එම අදාල මුදල් ලබා ගැනීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එම නීතිය බලපාන ආකාරය පිළිබඳව ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

කහටවිල ඉඩමේ අක්කර 03ක් තිබූ බවත්, එතැනදී බන්දුල සේනානායක සමාගම මිලදී ගැනීමේදී එක් අක්කරයක් පෞද්ගලිකව පුද්ගලයෙකුට ලබා දී ඇති බවත් අක්කර 2ක් කොටස් කල බවත් ගරු මන්ත්‍රීනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය ප්‍රකාශ කරන ලදී.එතැනදී එම අක්කරයද අවුරුදු 10ක කාල සීමාවකට මෙහා ඉවත් කල බැවින් තමන් මේ පිළිබඳව සොයා බලා සභාවට කොටසක් තිබෙන බවට පැවසූ බවත් නමුත් කිසිවෙකු එම කතාව පිළිනොගත් බවත් ප්‍රකාශ කරන ලදී.මේ වන විට තමන් පැවසූ දෙය නැවත ඉස්මතු වී ඇති බවත් , එවැනි නීතියක් තිබෙන බවට පවසන බවත් පසුගිය මහා සභාවේදීද මෙම ඉඩම පිළිබඳව කතා කල නමුත් මහා සභා වාර්තාවේවත් ඒ පිළිබඳව සඳහන් කර නොමැති බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. ගරු සභාපතිතුමා විසින් ලේකම්මහතාට ඒ සම්බන්ධ වාර්තාව ලබා දෙන බවට පසුගිය සභාවේදී පැවසූ නමුත් එයද සභා වාර්තාවේ සඳහන් වී නොමැති බවත් ප්‍රකශ කල අතර තමන් මේ පිළිබඳව කතා කරනුයේ කොට්ඨාසයේ ජනතාව වෙනුවෙන් බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම්මහතාට තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබුණි.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව ඉඩම් කට්ටිකිරීම සම්බන්ධයෙන් ගැසට් කර තිබෙන බවත්, එම ගැසට් නිවේදනය අනුව අක්කර 2 ½ ක ඉඩමක් කොටස් කරන්නේනම් පමණ 10% ක කොටස සභාවට හිමි වන බවත් , ඊට අමතරව මාර්ග සඳහා වෙන් වන කොටස් ඔප්පුවක් මඟින් සභාවට පවරා දිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී. 2016 සිට අතුරු ව්‍යාවස්ථාව ක්‍රියාත්මක වන බවත් 2016න් පසුව මෙම ඉඩම නැවත කැඩෙන්නේනම් එය අක්කර 2 ½ වඩා වැඩි වන්නේ නම් මුළු ඉඩම් ප්‍රමාණය සලකා බැලීමට කොමසාරිස්තුමා මුළු වයඹ පලාතටම වලංගු වන පරිදි තීරණය ලබා දුන් බවත් ප්‍රකාශ කරන ලදී.

අක්කර 2 ½ කට වඩා වැඩි නම් 10% ක් සභාවට ලැබෙන බවත් , අක්කර 10ක ඉඩමක් අක්කර දෙක බැගින් කොටස් පහකට කඩා තිබුණහොත් වසර 10ක් ඇතුළත එම අක්කර 2නුත් 10%ක් සභාවට ලබා ගත හැකි බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව මඟින් ඉඩමක් සම්බන්ධයෙන් කල කටයුත්තකදී විගණනයෙන් පැමිණ විගණන කටයුතු සිදු කර තිබූ බවත්, වැඩ අධිකාරි මහතා නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ සිට මෙහි පැමිණි පසුව නව ඉඩම් කට්ටිකිරීම් පැමිණීමේදී එය පෙන්වා දුන් බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. තම අත්සනින් යැවූ ලිපියට මේ වන විට තීරණයක් ලෙස මුළු වයඹ පලාතටම ක්‍රියාත්මක වන පරිදි කටයුතු යොදා ඇති බවත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම මෙම වැඩ කටයුත්ත හාල්දඩුවන ඉඩමක් කැඩීමෙන් ආරම්භ කල බවත් ප්‍රකාශ කරන ලදී.

මෙය 2016 සිට වලංගු විය යුතු බවත්, එසේ නම් එම වසර කීපය තුළ අක්කර 2ට වඩා වැඩි ඉඩමක් කොටස් කලේ නම් එයින් 10% ලැබිය යුතු බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී වැරදි අර්ථකථනයක් තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව......

නව ව්‍යාවස්ථාව කෙදින සිට ක්‍රියාත්මක වේදැයි ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

එය 2021 ඔක්තෝබර් මාසයේ සිට ක්‍රියාත්මක වන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම අතුරු ව්‍යවස්ථාව සභාගත කරන ලෙසට ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ඉල්ලා සිටින ලදී.

මෙවැනි ප්‍රශ්න ගැටළු නිතරම මතු වන බැවින් ඉංජිනේරුමහතෙකු වන ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතාව කමිටුවට ගෙන්වීමට යෝජනා කල බවත්,අද වන තෙක් එතුමාව නොකැඳවූ බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

යම්විට මන්ත්‍රීතුමාට පණිඩිඩය ලබා දීමට නොහැකි වූ බව ගරු සාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

නිල වශයෙන් කමිටුව සඳහා කැඳවීම කරන ලෙස ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

කමිටුවට කාර්මික නිලධාරීන් නොපැමිනෙන බවත්, ඒ පිළිබඳව ඇසූ විට ගරු සභාපතිතුමා රාජකාරි භාර දුන් බව පවසන බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

කමිටුව නියමිත වේලාවට රැස්වීමට කටයුතු යොදන ලෙසත්, තාක්ෂණ නිලධාරීන්ව කමිටුවට යොදවන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

කමිටුව දිනයේදී නිලධාරීන් නිවාඩු දමන බවත්, තමන් හදිසියේ හෝ නොපැමිණෙන්නේ නම් ඊළඟට සිටින ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමාට භාර දෙන බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මන්ත්‍රීවරුන්ද රාජකාරි අතරතුර කමිටුව වෙත සහභාගී වන බවත්, මාසයේ පළමු සහ තෙවන සිකුරාදා දින සවස් වරුවේ කමිටුව තිබෙන බවත් එම දින දෙක වෙන්කර ගැනීමටවත් නොහැකි නම් අනෙක් පරිපාලන කටයුතු කලමණාකරණය කරගන්නේ කෙසේදැයි සිතා ගත නොහැකි බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

සුළු රාජකාරී සඳහා තාක්ෂණ නිලධාරීන් නොයොදවා ඒවා සඳහා ආදායම් පරීක්ෂකවරුන් සහ අනෙක් නිලධාරීන් ඒ සඳහා යොමු කරවන ලෙස ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.මාර්ග සම්බන්ධව කටයුතු කිරීමේදී මන්ත්‍රීතුමාගේ ඉල්ලීම් ලිපිය සහ ස්ථානයේ ඡායාරූපය අවශ්‍ය බවත් තාක්ෂණ නිලධාරීන්ට එම ස්ථාන වලට යාමේදී ජංගම දුරකථනයක් රැගෙන යන ලෙසට පවසන ලෙසත් ,එමෙන්ම කමිටුවේ බලතල අනුව හේතු විමසීමට බලතල තිබුණද තවමත් ඒ අනුව කටයුතු නොකල බැවින් තාක්ෂණ නිලදාරීන්ව අනිවාර්යෙයන්ම කමිටුව වෙත සහභාගී කරවන ලෙසත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ජේ.සී.බී. යන්ත්‍රය මේ වන විට කැඩී ඇති බවත්, එය නිෂ්පාදිත රට පිළිබඳව තමාට දැන ගැනීමට අවශ්‍ය බවත් ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා ප්‍රකාශ කරන ලදී.

එය කැඩී නොමැති බවත්, වගකීම් කාලයක් ඒ සඳහා ලබා දී ඇති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

රාජ්‍ය ආයතන වල වාහන වෙන්දේසි කිරීම සහ  මිලදි ගැනීම සම්බන්ධයෙන් ක්‍රමවේදයම වෙනස් කල යුතු බව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව.....

ප්‍රසම්පාදන ක්‍රමවේදය හරහා තාක්ෂණ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ භාවිතා කරන ලද උපකරණයක් මිලදී ගැනීමට කොමසාරිතුමාට ඉල්ලීමක් කරමුයැයි ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.එමෙන්ම වැඩිදුරටත් කරුණු ඉදිරිපත් කරමින් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමේදී කමිටුවට දින 3කට වත් පෙර ඇස්තමෙන්තු ඉදිරිපත් කරන ලෙසටද ප්‍රකාශ කරන ලදී.

කමිටු සඳහා සහභාගී  නොවන මන්ත්‍රීවරුන් ඉවත් කර නව මන්ත්‍රීවරුන් පත් කරන ලෙස ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී.

කණ්ඩායම් දෙකෙහිම නොපැමිණෙන මන්ත්‍රීවරුන්ගේ නාමලේඛණය තමාට ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

යම් ඉඩමක් අක්කර දෙකට වඩා වැඩි වන විට එක් අක්කරයක් වෙනත් අයෙකුට විකුණා ඉතිරිය ඉතාමත් සූක්ෂමව කොටස් කරන බව ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.මෙ සඳහා විශේෂ අවධානය යොමු කරන ලෙසද ඉල්ලා සිටින ලදී.

ඝෝෂාව.....

ලිහිරියාගම පොළ භූමිය නිරීක්ෂණයට ගිය බවත්, එතැන කෝටි ගණනක් වියදම් කර සෑදුවද අප ජලය නිසි පරිදි ඉවත් නොවී පෞද්ගලික ඉඩමකට යන බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී. එහිදී බට උඩින් දමා ඇති බවත් එය ටයිල් යටින් යවා නිවැරදිව සකස් කරන ලෙසත් තවදුරටත් ඉල්ලා සිටින ලදී.

එය සකස් කරන ලෙසට තමන් පැවසූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 12

2021.12.03, 2021.12.24 සහ 2021.12.30 වන දින පැවති මාර්ග, ඉඩම්, ගොඩනැගිලි හා කාර්මික සේවා කාරක සභා වාර්තා සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රීඒ එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවල සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

**iv.** 2022-01-07 වන දින පැවති පොදු පහසුකම් හා ආපදා කලමනාකරණ කාරක සභා වාර්තාව සලකා බැලීම

මෙම වාර්තාවේ තුන්වන පිටුවේ " ලිහිරියාගම සතිපොල බදුදීම හා එහි අවම ලංසු වටිනාකම පිළිබඳ තීරණයක් ගැනීම " ලෙස සඳහන් වන බවත්, මුදල් කමිටුවේදී ලක්ෂ 10කට ආදායම් පරීක්ෂකවරුන් විසින් වාර්තාවක් යොමු කල බවත් ඒ පිළිබඳව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී.

එහිදී බිම් කොටස ගෙන ගණනය කර තිබූ බවත්, එය නිවැරදි නොවන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එසේ නම් එම වාර්තාව මුදල් කමිටුව විසින් අනුමත කල බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

එම වාර්තාව ගරු මහා සභාවට ඉදිරිපත් නොකල බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එය සොයා බැලීමේදී නිවැරදි නොවූ හෙයින් නැවතත් ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතාගේ අධීක්ෂණය යටතේ සම්පූර්ණ වාර්තාවක් ගැනීමට කටයුතු කල බව ගරු සභාපතිතුමා වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදී.

දෙසැම්බර් මස පොල තිබූ අවසන් සති දෙකේ වෙළඳුන් 50 පමණ සිටි බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

තමන් සත්‍ය කතා කරන බවත් ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතා සම්පූර්ණ අධීක්ෂණයක් කල බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

නිවැරදි වාර්තාවක් ගෙන ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලෙසට ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

තමන් දිගින් දිගටම මේ පිළිබඳව අවධානය යොමු කල බවත්, මීට සති තුනකට පෙර පොල නිරීක්ෂණයට තමන් ගිය බවත් ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී. එහිදී ලබා දී තිබූ වාර්තාවට අනුව පොළේ සෑම කඩකාමරයක්ම ගණනය කර එම ගණනය කිරීම වාර්තාගත කර තිබූ බවත්, නමුත් නත්තල ආසන්නයේ තිබූ මෙම පොළේ 50%කටත් වඩා වෙළඳුන් අඩු බවත් නමුත් පොළින් පිට වෙළඳුන් හතර පස් දෙනෙකු වෙළඳාම් කරමින් සිටි බවද ප්‍රකාශ කරන ලදී. එහිදි 50% පමණ වෙළඳුන් අඩු වූ පසුව 50% පමණ ආදායමද එම වාර්තාව අනුව අඩු වී යන බවත් මේ සම්බන්ධයෙන් වාර්තාවක් තමන් කමිටුව වෙත ඉදිරිපත් කල බවත් කඩ කාමර සියල්ල අගය කොට එම උපකල්පනයකට අනුව අදාල වාර්තාව ලබා දී තිබූ බවත් ප්‍රකාශ කරන ලදී.

තමන් එම පොළ පිළිබඳව දන්නා බවත්, එම වෙළඳුන් බොහෝ දෙනෙකු වෙළඳාම් කිරීමට ඇතුළතට යාමට අකමැති බවත් පාරේ සිටියද එම වෙළඳුන් සියළුම දෙනා වාගේ ගෙවීම් කරන බවද එබැවින් මෙම ඉදිරිපත් කල ප්‍රකාශය නිවැරදි නොවන බවද ගරු මන්ත්‍රීනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය ප්‍රකාශ කරන ලදී.

පොළේ වෙළඳ මහතුන් 50%කට වඩා කඩ කාමර වල නොසිටි බවත්, පිටතින් සිටි පස් හයදෙනා පොළ ඇතුලට ගියද විශාල පිරිසකගේ අඩුවක් තිබෙන බවත් තමන් වෙළඳාම් වැඩිම කාල වකවාණුවක ගිය බවත් ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව පොළ ඉදි කිරීමට යාමේදීද තමන් කර්මාන්ත කමිටුවේ යම් අදහසක් ප්‍රකාශ කල බවත්, තමන් එදා ඉලක්කම් සමඟ පැවසූ බවත් අප ලිහිරියාගමට එම පොළ ඉදි කිරීමට යාමේදී ඒ පිලිබඳව දුරදැක්මෙන් සිතීමට තිබූ බවත් මෙය නම් තර්කය තමන් එදා පැවසූ දෙය නිවැරදි බවත් ප්‍රකාශ කරන ලදී. ලිහිරියාගමට මෙවැනි පොළක් ඉදි කිරීමට තමන් අකමැති නොවූ බවත් ඊටත් වඩා දංකොටුව ප්‍රදේශයේ ජලය, වැසිකිලි නොමැති තැන් තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී. අතිගරු ජනාධිපතිතුමාට, ගරු අග්‍රාමාත්‍යතුමාට අප බැන වැදුනද අනුවණ වැඩ අප විසින් කර ඇති බවත් විශාල වියදමක් දැරීමේදී අනෙක් පසින් අප ආදායම් ඉපැයීය යුතු බවත් ප්‍රකාශ කරන ලදී. ලේකම්තුමාගෙන් නිතරම ප්‍රශ්න අසනුයේ තර්ක කරනුයේ සභාවේ පරිපාලන නිලධාරියා ලේකම්තුමා වන නිසා බැවින්යැයිද ප්‍රකාශ කරන ලදී. සභාපතිතුමා මහජන නියෝජිතයෙකු බවත්, එතුමාගේ හැසිරීම හා ලේකම්තුමාගේ හැසිරීම වෙනස් බවත්, මඟ පෙන්වීම කරන ලෙසත් එවිට මන්ත්‍රීවරුන් ලෙස ඒවා සඳහා මැදිහත්විය හැකි බවත් ප්‍රකාශ කරන ලදී. මෙහිදී කමිටු නිරීක්ෂණ කර ආදායම් පරීක්ෂකවරුන්ගේ වාර්තාව පිලිගැනීමට නොහැකි බවට වාර්තාවක් දෙන ලෙසත් කමිටුව හරහා මෙ සංශෝධනය කරන ලෙසද ඉල්ලා සිටින ලදී. වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව ලෙස කරගෙන යන මෙම වැඩ පිළිවෙල මෙලෙස සිදු නොවිය යුතු බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලද අතර මෙම ලිහිරියාගම සතිපොල සඳහා නිශ්චිත විනිවිදභාවයෙන් යුතු වැඩ පිළිවෙලක් සිදු කරන ලෙසද ඉල්ලා සිටින ලදී.

මෙය කාලෝචිත බවත්, නැවතත් කමිටුවක් මඟින් වාර්තාවක් ගනිමුයැයි ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා ස්වාධීන කමිටුවක් පත් කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහි සැබෑ තත්ත්වය පැවසීමට ලේකම්මහතාට අවස්ථාවක් ලබාදෙන ලෙසත් ආදායම් පරීක්ෂකවරුන්ට එතුමා වගකිවයුතු බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය කමිටුවක් වශයෙන් නැවත විශ්ලේශනය කරන ලෙසත්, ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා ඇතුළු ගරු මන්ත්‍රීවරුන්ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් ඒ සඳහා සහභාගී වන ලෙසත් ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී. පොලවල් ටෙන්ඩර් කිරීමට හා සභාව මඟින් සිදු කිරීමට සභාවට අයිතියක් තිබෙන බවත්, කිසිවෙකු කිරිමැටියාන පොළ පිළිබඳව කතා නොකල බවත්, එම පොළ ටෙන්ඩර්කරුවන් නොගන්නා පොලක් බවට පත් වී ඇති බවත් පාඩු ලබන පොලක් වි ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

සෝෂාව.....

වෙන්නප්පුව පොලේ පලා වර්ග විකුණන වෙළෙන්දෙකු රු 1500ක රු.2000ක මුදලක් උපයන බවත්, රු.700.00ක් කඩකුලී ගත් විට අතින් පාඩු කරගෙන වෙළඳුන් සිටින බවත් මෙය මාෆියාවක් බවත් දංකොටුව පොල හොඳින් කරගෙන යන බවත් ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.

වෙන්නප්පුව පොලේ මුදල් එකතු කරන පිරිසට රිසි ලෙස කටයුතු කිරීමට ඉඩක් ලබා දී නොමැති බවත්, ස්ථාන වර්ග කර අගය කොට ඇති බවත්, වැඩි වෙලඳ වටිනාකමක් තිබෙන ස්ථානයක කවුරුන් සිටියද එම ස්ථානයට අයකල යුතු මුදල ගැනීමට සිදු වන බවත් අඩු ස්ථානද පොලේ තිබෙන බවත් ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය නිවැරදිව කලමනාකරණය කිරීමට නිලධාරියෙකු යොදවන ලෙස ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.

එම වෙළඳුන්ගේ තොරතුරු සභාගත කරන ලෙස ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී.

සවිස්තර වාර්තාවක් ඊළඟ මහා සභාවට යොමු කරන බව ගර සභාපතිතුමා දැනුම්දෙන ලදී.

වීථි ලාම්පු ප්‍රතිසංස්කරණය කිරීමට උදාසිරිගම කොට්ඨාසයට පැමිණීමට තිබුයේ 6 වන දින බවත් නමුත් අදාල කල සටහන 8 වන දින WHATSAPP GROUP එකට දමා තිබූ බවත් 6 වන දින වාහනය නොපැමිණි බවත් 7 වන දින කතා කර එවීමට විමසුවද තමන් එය 8 වන දින එවන ලෙසට පැවසූ නමුත් එදිනද නොඑවූ බවත් දුරකථනයටද ප්‍රතිචාර නොදැක්වූ බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී. වෙනත් කොට්ඨාසයක අළුත්වැඩියාව කර යාමේදී හදිසියේ තම කොට්ඨාසයේ වීථි ලාම්පු කීපයක් සකස් කර ගොස් තිබූ බවත් ප්‍රකාශ කරන ලදී. මෙහිදී මෙම වැඩ කටයුත්ත ක්‍රමවත් නොවන බවත්, මේ සඳහා පත්කර තිබෙන නිලධාරියා මන්ත්‍රීවරුන් සමඟ සම්බන්ධ වන්නේ නම් පැමිණීමට දිනකට පෙර හෝ කොට්ඨාසයට පැමිනෙන දිනය දැන ගන්නා බවත් පළමුවැනිදා සිට විදුලි පහන් අළුත්වැඩියා කලද 8 වන දින අදාල කාලසටහන ලබා දුන් බවත් ප්‍රකාශ කරන ලදී.

ජනවාරි මස 3 වන දින වැඩ ආරම්භ කල බවත් වැඩ කටයුතු ක්‍රමවත්ව ආරම්භ කිරීමේදී 5 වන දින සිට ක්‍රියාත්මක වූ බවත් නමුත් යම් කාර්මික නිලධාරීන් අසනීප වී තිබූ බැවින් සේවකයින් නොමැති වූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.කොට්ඨාස වල එතරම් අළුත්වැඩියා නොමැති බවත්, අද වන විට එක් වාහනයක් පමණක් වැඩ කරන බවත් ප්‍රකාශ කරන ලදී. සිටින පිරිසෙන් මෙම වැඩ කටයුතු කරගෙන ගිය බවත් ප්‍රකාශ කරන ලදී.

එසේ නම් දින පිළිවෙලට ඒවා සකස් කිරීමට ගරු සභාපතිතුමා කලමනාකරණය කල යුතු බවත්, 6 වැනි දින සකස් කිරීමට තිබූ කොට්ඨාසය අතහැර අනෙක් දිනයේ සිට අළුත්වැඩියා කටයුතු සිදු කර ඇති බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

ලයිට් වාහනය පැමිණෙන්නේ නැතිනම් ඊට පෙර දින දැනුම් දෙන ලෙසත්, මෙම ප්‍රශ්න තේරුම් ගැනීමට හැකි පිරිසක් මෙහි සිටින බවත් ප්‍රාදේශීය සභාවට අළුත්වැඩියා දැනුම් දීමට ජනතාව පුරුදු වී සිටින බවත් එය නොසැදූ විට කොට්ඨාස මන්ත්‍රීවරයාට පවසන බවත් ඒ සම්බන්ධයෙන් දැනුවත් වී නොමැති බැවින් එහිදී මන්ත්‍රීවරයා අපහසුතාවයට පත් වන බවත් ගරු මන්ත්‍රීනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය ප්‍රකාශ කරන ලදී.

සෝෂාව.....

ලබන සතියේ ත්‍රීවීලර් රථය අළුත්වැඩියාවට දමන බවත්, එහිදී එක් වාහනයක් පමණක් විදුලි අළුත්වැඩියාවට යන බැවින් සිටින සේවක පිරිස දෙකට බෙදා එම වැඩ කටයුතු සිදුකිරීමට කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තමන්ටද ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතාට පැමිණි ගැටළුව පැමිණි බවත් තමන් ඒ පිළිබඳව අදාල නිලධාරියාගෙන් විමසා එය පැහැදිලි කරගත් බවත් මේ මාසයේ අවුරුදු නිවාඩුව පැමිණි බැවින් මාසයේ පළමුවැනිදා ලෙස හතරවැනිදා සලකා කටයුතු කර තිබූ බවත් එලෙස පසුව තම කොට්ඨාසයේ අළුත්වැඩියාවට පැමිණි බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

සභාවේ අවමංගල්‍යා උත්සව වලට යොදා ගන්නා ෆ්ලැෂර් අක්‍රීය වී ඇති බැවින් ඒ සඳහා අදාල කටයුතු සිදු කරන ලෙස ගරු මන්ත්‍රීනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය ඉල්ලා සිටින ලදී.

ඊයේ දිනයේ මුදල් කමිටුව තිබූ බවත් විදුලි උපාංග සඳහා නව මිල ගණන් අනුමත වූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

දෙසැම්බර් මස තාවකාලික කඩ මාර්ගය දෙපසම දමා තිබූ බවත්, එයට කවුරුන් අවසර දුන්නේදැයිද තමන් නොදන්නා බවත්, ඊළඟ මහා සභාවට සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසටද ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

ඒ සම්බන්ධ සම්පූර්ණ වාර්තාවක් ලබාදෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 13

2022-01-07 වන දින පැවති පොදු පහසුකම් හා ආපදා කලමනාකරණ කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රීඒ එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

v. 2021-11-26 වන දින පැවති සංවර්ධන කාරක සභා වාර්තාව සලකා බැලීම

තීරණ අංක 14

2021-11-26 වන දින පැවති සංවර්ධන උපදේශක කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී ඒ. එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

vi. 2021-12-28 වන දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව සලකා බැලීම

තීරණ අංක 15

2021-12-28 වන දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී ඒ. එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

## 05.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සළකා බැලීම.

I. මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය- 2021 ඔක්තෝබර්
II. මාසික ඒකාබද්ධ ගෙවීම් සාරාංශය - 2021 ඔක්තෝබර්

තීරණ අංක 16

2021 ඔක්තෝබර් මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය හා 2021 ඔක්තෝබර් මස මාසික ඒකාබද්ධ ගෙවීම් සාරාංශය පිළිබඳ වාර්තා සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

III. 2021 දෙසැම්බර් මස ඉන්ධන හා අලුත්වැඩියා වෙනුවෙන් වියදම් වූ වාර්තාව ගරු මහා සභාව සලකා බලන ලදී.

## 06. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම.

i. ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව තඹරවිල පාසලට යාබදව තිබෙන ඉඩම වසර ගණනාවක සිට තිබෙන බවත්,කවුරුන් හෝ භාවිතයටද නොගන්නා බවත් එබැවින් එය ප්‍රාදේශීය සභාවේ 19 වන වගන්තියේ සිට 22 වන වගන්තිය දක්වා තිබෙන කොටස අනුව එය සභාවට පවරා ගනිමුයැයිද මේ පිළිබඳව ප්‍රා දේශීය ලේකම්තුමියට දන්වා යවමුයැයිද යෝජනා කරන ලදී. මෙය පාසලේ පොදු කටයුතු සඳහාද යොදා ගත හැකි බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

| |
|---|
| තීරණ අංක 17<br><br>**තඹරවිල පාසලට යාබදව තිබෙන පර්චස් 20ක ඉඩම් කැබැල්ල ප්‍රාදේශීය සභා පණතේ ප්‍රතිපාදන ප්‍රකාරව පවරා ගැනීම සුදුසු බවටත්, ඒ පිළිබඳව ප්‍රාදේශීය ලේකම්තුමාට දන්වා යැවීම සුදුසු බවටත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.** |

ii. තුලාවල කොට්ඨාස මන්ත්‍රීතුමා නිතරම ක්‍රීඩා පිටියක් සම්බන්ධයෙන් ඉල්ලීම් කල බවත්, ඒ සඳහා තක්සේරුව පැමිණ ඇති බවත් මේ සඳහා ලක්ෂ 100 වෙන්කල නමුත් රජයේ තක්සේරුව ලක්ෂ 150 වන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කල අතර මෙහි ඉතිරි මුදල ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රතිපාදන වලින් ගැනීමට සිදුවන බවත් ප්‍රකාශ කරන ලදී.

තුලාවල කොට්ඨාසය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන මුදල් එයට යොදවා මෙම කටයුතු සිදු කරන ලෙස ගරු මන්ත්‍රී කේ.එල්. චමින්ද කුමාර කරුණානායක මහතා එකඟතාවය ලබා දෙන ලදී.

ලබන සතිය වන විට මෙම කටයුතු සිදු කර අවසන් කරන බවත්, හැකිනම් අයිතිකරු සමඟ කතාකර යම් මුදලක් අඩු කරගන්නා ලෙසද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

රජයේ නිලධාරීන්ගෙන් එම රහස් පිටතට යන බවත්, තක්සේරු නිළධාරියා ඉඩම් හිමියාට කතා කොට මේ සම්බන්ධයෙන් පවසා තිබූ බවත් ගරු මන්ත්‍රී කේ.එල්. චමින්ද කුමාර කරුණානායක මහතා ප්‍රකාශ කරන ලදී.

එහි බොරළු කැණීම් කිරීමට නොහැකිදැයිද , එවිට වැය වූ වියදම් සොයා ගැනීමට හැකිවේයැයිද ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

එහි බොරළු කැණීම් කිරීමට ලබාදිය නොහැකි බව ගරු මන්ත්‍රී කේ.එල්. චමින්ද කුමාර කරුණානායක මහතා ප්‍රකාශ කරන ලදී.

iii. සිරිගම්පල පිහිටවූ නව පොලිස් ස්ථානයට බණ්ඩිරිප්පුව කොට්ඨාසයේ සහ බොරලැස්ස කොට්ඨාසයේ වසම් කීපයක්ද අයත් වී ඇති බවත්, එම පොලිස් ස්ථානයට යාමට ඒමට ජනතාවට අපහසු බවත්, මේ සම්බන්ධයෙන් තවමත් සුළු පිරිසක් දන්නා බැවින් ඔවුන් නිතරම තමාටද මේ පිළිබඳව පවසන බවත් ගරු මන්ත්‍රී ඒ. රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කල අතර මෙම කොට්ඨාස දෙක එම පොලිස් ස්ථානයෙන් ඉවත් කර දෙන ලෙසටද ඉල්ලා සිටින ලදී. එමෙන්ම එම

පොලිසිය විසින් ජනතාවට පීඩා කරමින් රජය අපකීර්තියට පත් කරන බවද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව.....

මෙය ගරු රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මැතිතුමා හරහා සිදු කර දෙන ලෙසට ගරු මන්ත්‍රිනි ආර්. නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය ඉල්ලා සිටින ලදී. පොලිසියට පොලිස් වසම වෙනස් කිරීමට නොහැකි බවත් පොලිස්පතිතුමා හරහා නියෝගයකින් මෙය වෙනස් කල යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

අදාල පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් මේ පිළිබඳ විමසීමට තිබූ බවත්, සිරිගම්පල කුඩු, ගංජා,අරක්කු ජාවාරම් නතර කිරීමට මෙය ස්ථාපිත කර ඇති බවත් තොඩුවාවට බෝට්ටු මඟින් එම ජාවාරම් සිදු කරන බැවින් ඒවා සඳහා මෙය ස්ථාපිත කල බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම පොලිසිය පිහිටුවීමට පැල තවාන ඉඩමෙන් පර්.80ක් දීමට ගරු ඇමතිතුමා කැමති වූ බවත්, සහකාර පොලිස් අධිකාරිතුමාවද ගෙන්වා මේ පිළිබඳව පැවසූ බවත් එම අවස්ථාවේදී එකඟ වූ බවත් නමුත් මේ වන විට පොදු ඉඩමෙන් අක්කරයක් ඉල්ලා සිටින බවත් ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී. මේ වන විට පෞද්ගලික ගෙයක් කුලියට ගෙන සිටින බවත්, සවස් වන විට හංදි ගානේ ගොස් වාහන නතරකර ජනතාවට කරදර කරනා බවත් මීට වඩා වෙන්නප්පුව පොලිසියම මෙය පාලනය කලේ නම් හොඳ බවත් තවදුරටත් ප්‍රකාශ කල අතර මෙය නිවැරදිව පොලිසියක් ලෙස ක්‍රියාත්මක නොවුනහොත් විහලුවක් බවට පත් වන බවත් ප්‍රකාශ කරන ලදී.

ලබන වසරේ විශ්‍රාම යන වයසේ පිරිසක් මෙහි සේවය කරන බවත්, සිරිගම්පල වැනි ප්‍රදේශවලට තරුණ පොලිස් නිළධාරීන් පිරිසක් අවශ්‍ය බවත් ගරු මන්ත්‍රිනි ජේ.කේ. දීපා මේරි අයිරංගනි පෙරේරා මහත්මිය ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව....

අඩු පිරිසක් මඟින් පොලිස් ස්ථානයක් කල නොහැකි බවත් ඒ සඳහා නියමිත නිලධාරී සංඛ්‍යාවක් සිටිය යුතු බවත් ගරු මන්ත්‍රී බී. ඒ.එස්. ශාන්ත පෙරේරා මහතා ප්‍රකාශ කරන ලදී.

මේ පිළිබඳව පොලිස්පතිතුමාට සහ ගරු අමාත්‍ය සරත් වීරසේකර මැතිතුමාට දැන්වීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

iv. ඉදිකිරීම් ක්ෂේත්‍රයේදී සිමෙන්ති මිලදී ගැනීමට නොහැකි වී ඇති බවත්, සිමෙන්ති ගැනිමට පෝළිම් වල සිට තැරැව්කරුවන් ඒවා වැඩි මිලට විකුණන බවත් ගරු මන්ත්‍රී බී. ඒ.එස්. ශාන්ත පෙරේරා මහතා ප්‍රකාශ කරන ලදී. මෙය නවතම ජාවාරම වී ඇති බවත්, විදේශගතව සිට පැමිණෙන මිනිසුන්ට මාසයක පමණ නිවාඩුවක් ලැබෙන බැවින් ඔවුන්ගේ කටයුතු කර ගැනීමට නොහැකි වී ඇති බවත් මේ සඳහා කිනම් හෝ ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

මෙහිදී විවිධ සිමෙන්ති සමාගම් සඳහා නියෝජිතයින් සිටින බවත් කෙසේ නමුත් මේ පිළිබඳව සොයා බලා ඉදිරි කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

v. ඩී.ඒ.රාජපක්ෂ අනුස්මරණ අන්තර් ආයතන එල්ලේ තරඟ මාලාව සඳහා වැය වන රු.133,500.00ක මුදල සභාව මඟින් වැය දැරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා ඉදිරිපත් කරන ලදී.

මෙහිදී අප සභාවේ එල්ලේ කණ්ඩායමක් සහභාගී වන බවත්, වියදම් ඇස්තමේන්තුව ද තිබෙන බවත්, මෙහිදී දින 4කට වියදම තිබෙන බවත් දිනකින් දෙකකින් පැමිණියහොත් එම මුදල අඩු කරගන්නා බවත් ක්‍රමවත් පරිදි මෙම මුදල ලබා දෙමුයැයිද ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී.

තීරණ අංක 18

ඩී.ඒ.රාජපක්ෂ අනුස්මරණ අන්තර් ආයතන එල්ලේ තරඟ මාලාව සඳහා සභාව නියෝජනය කරමින් සහභාගී වන එලලේ කණ්ඩායමට අවශ්‍ය පහසුකම් සැපයීම වෙනුවෙන් ඉදිරිපත් කර ඇති රු.133,500.00ක ඇස්තමේන්තු මුදලට සභාව මඟින් වැය දැරීම **සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී**

Vi. මැ/ලුණුවිල "සුපිපි ප්‍රජා මණ්ඩලය" පිහිටුවීම සඳහා පලාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී.

තීරණ අංක 19

වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මැ/ලුණුවිල වසමේ " සුපිපි ප්‍රජා මණ්ඩලය" පිහිටුවීම සඳහා වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතියට යැවීමට ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

vii. ද/බොරලැස්සට සහ බ/බොරලැස්සට මායිම් වී තිබෙන ඇළ මාර්ගය රක්ෂිතයක් බවත් එයට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අයිතියක් නොමැති බවට පවසන බවත් පසුව එම ඉඩම මැනුම් කල පසුව එහි පර්චස් 23ක භූමි ප්‍රමාණයක් තිබෙන බවත් මේ වන විට බිම් සවිය මඟින් පිඹුරුපත් සාදා ඇති බවත් ගරු මන්ත්‍රිනි ආර්. නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය ප්‍රකාශ කරන ලදී. ඒ අවට ජනතාව ගොඩකරගෙන ව්‍යාපාර සිදු කරන බවත් එබැවින් මේ වසරට තමන්ට වෙන් වී ඇති ප්‍රතිපාදන මුදලින් එම භූමිය වෙන් කර වැටක් ඉදි කරදෙන ලෙසත් එම පිඹුරුපතේ සභාව සතු කොටස වෙන් කර ගන්නා ලෙසත් ඉල්ලා සිටින ලදී.

viii. ශ්‍රීමත් ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණයේ පිහිණුම් තටාකය මේ වන විට ඉතාමත් පහළ ස්ථානයක තිබෙන බවත්, අළුත්වැඩියා කිරීමට තිබෙන බවත්, එමෙන්ම ගස් කැපීමට ගොස් දැල ගලවා ඇති බවත්, එබැවින් දින කීපයක්ම පිහිණුම් තටාකයට පන්දු වැටී ඇති බවත් පූල් එකේ මිල ගනන් වැඩි කර ඇති බවත් නමුත් ප්‍රදර්ශන පුවරුවේ රු.100 ලෙස සඳහන් කර රු120 ටිකට් එකක් අතින් ලියා ලබා දෙන බවත් මේවා නිවැරදි කරන ලෙස ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

පුහුණුකරුවන් මුදල් එකතු කර අදාල මුදල සබාවට ලබාදෙන බවත්, මෙහිදී නිශ්චිත ළමුන් ගණන අපට ගණනය කර ගත නොහැකි බැවින් ළමුන් පැමිණ සභාවට මුදල් ගෙවන ක්‍රමවේදයක් සකස් කර ගන්නා ලෙසත් එවිට වැඩි ආදායම් ලබා ගත හැකි බවද ප්‍රකාශ කල අතර වැසිකිළි පද්ධතියද අපිරිසිදුව නුසුදුසු තත්ත්වයේ පවතින බැවින් මේවා සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් දක්වා අදාල ඉදිරි කටයුතු කරන ලෙසටද ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ඉල්ලා සිටින ලදී.

මෙම පෙන්වා දුන් කාරණා සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතාට ක්‍රීඩා කමිටු සභාපති ගරු මන්ත්‍රී කේ. නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ස්තුතිවන්ත වන ලදී.

මේවා පිළිබඳව ක්‍රීඩා කමිටුවේ සාකච්ඡා කර මහා සභා අනුමැතිය ලැබුණද තාක්ෂණ නිළධාරීන් මෙම කටයුතු වලට සහභාගී නොවන බවත් අවශ්‍ය මුදල් ප්‍රතිපාදනද නොලැබෙන බවත් එබැවින් ක්‍රීඩා කමිටුව පැවැත්වීමද ප්‍රතිඵල ශුණ්‍ය බවත් ප්‍රකාශ කරන ලදී. කෙසේ නමුත් එළඹෙන බදාදා දින ශ්‍රීමත් ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණයේ මෙම කමිටුව පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති බවත් මේ සඳහා නිලධාරීන් සහභාගී කරවන ලෙස ලේකම්මහතාටද දන්වා සිටින ලදී. ව්‍යායාම උපකරණ කට්ටල කීපයක්ද තිබෙන බවත් ඒවාද අබලන් වී ඇති බවත් මේ කාරණා සම්බන්ධයෙන් ගරු සබාපතිතුමාගේ අවධානය යොමු කරන ලෙසද ඉල්ලා සිටින ලදී.

අපට ඉඩම ලබා දුන් අයිතිකරු විසින් අනෙක් පස ඉඩමේ ඉදි කිරීමක් කරන බවත්, එහි දූවිලි සියල්ල පිහිණුම් තටාකයට යන බවත් එමෙන්ම පැවිලියන් එකේ වයර් රැහැනක් ඇද ඇති බවත් මේවා සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරන ලෙසත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ඉල්ලා සිටින ලදී.

ix. නයිනමඩම ක්‍රීඩාංගණය සඳහා ගිය වසරේ මුදල් වලින් රුපියල් තිස් නව ලක්ෂ පනස් දහසක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ගෙවූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. රජයේ තක්සේරුව බැන්ද නමුත් ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් ඔවුන්ගේ එක්කෝටි ගණනක තක්සේරුවක් එවා ඇති බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

කේවියට් තහනම ගොණු කලේදැයි ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

එය ගොණු කල බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

අයිතිකරුවන් එකල ඉඩම ලබා දීමට එකඟවුවද සභාවක් ලෙස නිසි පරිදි එම කටයුතු සිදු කරගෙන නොමැති බවත් ගරු මන්ත්‍රී කේ.එල්. චමින්ද කුමාර කරුණානායක මහතාගේ ක්‍රීඩා පිටිය ගත් මුදල හා සැසදීමේදී මෙම ක්‍රීඩ් පිටියේ ද වටිනාකමක් තිබෙන බවත් ගරු මන්ත්‍රී ඩබ්. ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මෙම මුදල ලබා දීමට තමන් ජයන්ත මහතාට සහ ඔහුගේ පුත්‍රයාට තක්සේරුවක් ගෙන එන ලෙස පැවසුවද ඔවුන් එය මඟ හරින බවත්,බලෙන් ගොස් තක්සේරු කිරීමට අයිතියක් නොමැති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. මෙහිදී පීඩනය තමාට වැඩි වන බැවින් තමාට පැමිණ ඇති පැරණි තක්සේරුවට මුදල් බඳින ලෙසට තමන් පැවසූ බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

නව තක්සේරුවක් ගන්නා ලෙස ගරු මන්ත්‍රීවරුන් මෙහිදී ප්‍රකාශ කරන ලදී.

ග්‍රාම සේවක මහින්ද දැනට තිබෙන අගයට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් තක්සේරුවක් ගෙන ඇති බවත්, ගොවිජන සේවා ආයතනයේ මෙය කුඹුරු ඉඩමක් ලෙස සඳහන් කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රීවරුන්ද මෙහිදී මේ සම්බන්ධයෙන් අදහස් දක්වන ලදී.

x. ළමා හා කාන්තා කමිටුවට දිනයක් හා අදාල සාමාජිකයින් පක්ෂ විපක්ෂ ලෙස නම් කර එවන ලෙසට ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

න්‍යාය පත්‍රය අනුව සියළු වැඩ කටයුතු අවසන් වූ හෙයින් සියලු දෙනාටම ස්තුතිය පළ කරමින් ගරු සභාපතිතුමා විසින් ප.ව 2.00 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.